ලංසු සඳහා ආරාධනය (IFB)

විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය
බදු පදනම මත ගොඩනැගිලි පහසුකම් ලබා ගැනීම

(MTDI/ACCT/2016/04/31)

01. විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය ස්ථාපනය කිරීම සඳහා වර්ග අඩි 25000කින් යුත් වාහන 50ක් ගාල් කිරීමට හැකි අඛණ්ඩ ජල පහසුකම්, විදුලි පහසුකම් (එක් එක් මහල සඳහා වෙන් වෙන්ව සවි කරන ලද මනු යන්ත්‍ර සහිත), මධ්‍යගත වායු සමීකරණ පද්ධති, විදුලි සෝපාන, ආරක්ෂක විධිවිධාන සහිත ගොඩනැගිල්ලක් පහත සඳහන් ප්‍රදේශ වලින් බදු පදනම මත ලබා ගැනිමට අවශ්‍යව ඇත. (i) රාජගිරිය (ii) බත්තරමුල්ල (iii) කොළඹ 02 (iv) කොළඹ 03 (v) කොළඹ 04 (vi) කොළඹ 05.

02. ජාතික තරඟකාරී ලංසු පටිපාටිය (NCB) ට අනුකූලව ලංසු කැඳවීමේ, ඇගයීමේ හා පිරිනැමීමේ ක්‍රියා පටිපාටිය සිදු කරනු ඇත.

03. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩි දුරටත් අවශ්‍ය වන තොරතුරු කොළඹ 03, 79/1, පස් වන පටුමග, විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශයෙන් (දුරකථන අංක: 011-2577330) ලබා ගත හැකි අතර සතියේ දිනවල පෙ.ව. 09.00 සිට ප.ව.03.00 දක්වා ලංසු ලියවිලිද ගාස්තුවකින් තොරව පරීක්ෂා කර බැලිය හැකිය. මීට අමතරව අදාල ලංසු ලේඛණ පරීක්ෂා කිරිම සඳහා පමණක් පහසුකම් www.mtdi.gov.lk වෙබ් අඩවියෙහි සපයා ඇත.

04. ආපසු නොගෙවන රු. 30,000/= ක ගාස්තුවක් මුදලින් ගෙවා 2017 පෙබරවාරි මස 06 දින පෙ.ව.9.00 සිට 2017 පෙබරවාරි මස 27 දින ප.ව. 3.00 දක්වා ලිඛිත අයදුම්පතක් ප්‍රසම්පාදන අංශය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු මීට අභිලාෂය දක්වන ලංසුකරුවන්ට ඉංග්‍රිසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලියවිලි කට්ටලයක් මිලදී ගත හැක. මෙම ලංසු ලේඛණ නිකුත් කිරීම සිදු කරනු ලබන්නේ කාර්යාල දිනයන්හි දී පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා පමණි.

05. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් 2017.02.06 දින සිට 2017.02.28 දින ප.ව.2.00 දක්වා කාර්යාල දිනයන්හි දී මුද්‍රා තබන ලද ලංසු ලේඛණ අමාත්‍යාංශයේ 2 වන මහලේ ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. එසේ නැතහොත් මුද්‍රා තබන ලද ලංසු ලේඛණ ඉහත ලිපිනයට නියමිත දින නියමිත වේලාවට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලංසු ලේඛණ බහාලන ලියුම්කවරයේ වම්පස ඉහල කෙළවරේ **"බදු පදනම මත ගොඩනැගිලි පහසුකම් ලබා ගැනීම - 2017"** වශයෙන් සඳහන් කළ යුතුය.

06. සියලුම ලංසුකරුවන් ලංසු ලේඛණ සමඟ රු:1,800,000.00ක ලංසු ඇපකරයක් ඉදිරිපත් කල යුතුය.

07. 2017 පෙබරවාරි මස 28 වන දින ප.ව. 2.00 ට ලංසු භාර ගැනීම අවසන් කෙරේ. ලංසු භාර ගැනීම අවසන් කළ වහාම ඉහත දැක්වෙන ලිපිනයේදී එදිනම ප.ව.2.00 ට ඒවා විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට ලංසුකරු හෝ බලයලත් එක් නියෝජිතයෙකුට පමණක් සහභාගි විය හැක. ප්‍රමාද වී ලැබෙන ලංසු විවෘත කිරීමකින් තොරව අදාළ ලංසුකරු වෙත ආපසු එවනු ඇත.

08. මෙම ප්‍රසම්පාදනය සඳහා ලංසු කැඳවීම හෝ ලංසු කැඳවීම අවලංගු කිරීම හෝ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අභිමතය පරිදි සිදුවේ.

සභාපති
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව
විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය
අංක 79/1, 5 වන පටුමග, කොළඹ 03.
2017.02.06